# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.05 පැය 2330 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2170/25 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන වීඩියෝ පටයක් සම්බන්ධව.**

දිවයින පුරා පැවති අයහපත් කාලගුණ තත්ත්වයෙන් අවතැන්වූ පිරිස් වෙත සහනාධාර බෙදා දීමේදී කලහකාරී ලෙස හැසිරුණු පුද්ගලයෙකු පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීමේ සිද්ධියක් දැක්වෙන වීඩියෝ දර්ශනයක් මේ දිනවල සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වෙමින් පවතී.

ඒ අනුව මෙම සිද්ධිය 2025.12.04 වන දින සේරුනුවර පොලිස් වසමේ අරියමංකේණි ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරිණිය සහ ස්වෙච්ඡා සංවිධානයක සහභාගිත්වයෙන් ලිංගපුරම් ප්‍රදේශයේ ගංවතුරින් අවතැන්වූවන්ට සහනාධාර බෙදා දීමේදී එම ග්‍රාම නිලධාරිණියට පුද්ගලයින් දෙදෙනෙකු පරුෂ වචනයෙන් බැණ වදිමින් ඇයගේ රාජකාරියට බාධා කර, සහනාධාර බෙදා දීමට ද බාධා වන අයුරින්, කලහකාරී ලෙස හැසිරීමක් සම්බන්ධයෙන් එම ග්‍රාම නිලධාරිණිය විසින් සේරුනුවර පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදු කර ඇත.

ඒ අනුව සේරුනුවර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2025.12.04 වන දින මෙම සිද්ධියට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර එම ස්ථානයේ සිටි පුද්ගලයෙකු විසින් පොලිස් නිලධාරීන්ට බැන වදිමින් එම සිද්ධිය ජංගම දුරකථනයකින් වීඩියෝ ගත කර එය සමාජ මාධ්‍ය වෙත මුදා හැර ඇත.

මෙම වීඩියෝව සමාජ මාධ්‍යට මුදා හරින ලද පුද්ගලයා අත්අඩංගුවට ගත් සැකකරුගේ මස්සිනා වන බවට අනාවරණය වී ඇති අතර මොහු පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට සාපරාධි බලහත්කාරය පෑම සම්බන්ධව සේරුනුවර පොලිසිය විසින් මූතූර් ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත. එම සැකකරු මේ වනවිට ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා සේරුනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**